# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
# அனர்த்த முகாமைத்துவ நிலையம்
# DISASTER MANAGEMENT CENTRE

අංක 120/2,
විද්‍යා මාවත,
කොළඹ 07

எண் 120/2
வித்யா மாவத்தை
கொழும்பு 07

No 120/2,
Vidya Mawatha,
Colombo 07


ඔබේ අංකය / உமது இல / Your No. }

මගේ අංකය / எனது இல } DMC/ 08/ Weather Forecast

දිනය / திகதி } 2026.01.08

**රතු නිවේදනය**

යුද්ධ හමුදාධිපති,

ගුවන් හමුදාපති,

නාවික හමුදාධිපති,

පොලිස්පති,

අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව,

අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව,

සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,

**<u>පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදනයයි.</u>**

2026.01.08 වන දින 1030 පැයට කාලගුණ විද්‍යා දෙපාර්මේන්තුව විසින් නිකුත් කරන ලද කාලගුණ නිවේදනය හා බැදේ.

02. එබැවින් සිදුවිය හැකි ආපදා තත්ත්වයන් අවම කිරිමට / පාලනය කර ගැනිමට හා කළමනාකරණය කර ගැනිම සඳහා මෙම නිවේදනය අනුව කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. තවද එම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නිවේදන පිළිබඳව විමසිලිමත්ව කටයුතු කරන මෙන් ද මෙම නිවේදන පිළිබඳ විස්තර ලබා ගැනිම සඳහා 117 දුරකථන අංකය අමතන ලෙසටද වැඩිදුර තාක්ෂණික උපදෙස් ලබා ගැනිම සඳහා **<u>කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව</u>** සමඟ සම්බන්ධිකරණය වන ලෙසටද කාරුණිකව ඉල්ලා සිටිමි.

එච්.බී.ජී.ප්‍රියන්ත
නියෝජ්‍ය අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)
රාජකාරි භාර නිළධාරී
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට




දුරකථන / தொலைபேசி / Telephone } 011 2136136

ෆැක්ස් (කාර්යාලය) / தொலைநகல் (அலுவலகம்) / Fax (Office) } 011 2 670079, 011 2670025

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General } 011 2670070, 011 2136100

Web: www.dmc.gov.lk Email: dg@dmc.gov.lk

හදිසි ඇමතුම් / அவசர நடவடிக்கை அழைப்பு / Emergency Operations Hotline : 011 2136222/011 2670002

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **05** TCA/26/01/08/01
වර්ණය : රතු

**ගිනිකොණදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින ගැඹුරු පීඩන අවපාතය පිළිබඳ අනතුරු ඇඟවීම් නිවේදනය**

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2026 ජනවාරි මස 09 වන දින පෙ.ව. 10.30 දක්වා වලංගු වන පරිදි 2026 ජනවාරි මස 08 දින පෙ.ව. 10.30 ට නිකුත් කරන ලදී.


## ගොඩබිම් ප්‍රදේශ සහ දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා

**ආරක්ෂිත ක්‍රියාමාර්ග ගන්න!**

**ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ ස්ථාපිතව පැවති පීඩන අවපාතයය අද (08) පෙ.ව. 05.30 වන විට ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී පොතුවිල් සිට 420 km ක් ගිනිකොණ දෙසින්, අක්ෂාංශ 5.4°N සහ දේශාංශ 85.3°E ආසන්නයේ කේන්ද්‍රගතව පැවතුනි. දැනට (පෙ.ව.10.00) එම පද්ධතිය පොතුවිල් සිට 300km පමණ ගිනිකොණ දෙසින් ස්ථානගතව පවතී.**

**මෙම පද්ධතිය නිරිතදිග බෙංගාල බොක්ක හරහා බටහිරට බරව වයඹ දෙසට ගමන් කර හෙට (2026 ජනවාරි 9) ප.ව.5.30 ත් ප.ව.11.30ත් අතර කාලය තුළ හම්බන්තොට සහ කල්මුණේ අතරින් ශ්‍රී ලංකා වෙරළ තීරයට ඇතුළු වීමට බොහෝ දුරට හැකියාව පවතී.**

**එහි බලපෑම හේතුවෙන් අද (08) දින සිට දිවයිනේ, විශේෂයෙන් උතුරු, උතුරු-මැද, නැගෙනහිර, ඌව සහ මධ්‍යම පළාත්වල වැසි සහ සුළං තත්ත්වයේ වර්ධනයක් බලාපොරොත්තු වේ.**




*ගැඹුරු පීඩන අවපාතයේ ගමන් මාර්ගය. මූලාශ්‍රය: RSMC*

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


**ගොඩබිම ප්‍රදේශය සඳහා :**
**ඉදිරි දින තුන සඳහා තද සුළං පිළිබඳ අනතුරු ඇඟවීම.**

| පළාත | ජනවාරි 08 | ජනවාරි 09 | ජනවාරි 10 |
|---|---|---|---|
| උතුර | විටින් විට පැ.කි.මී.(50-60) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(60-70) පමණ දක්වා වන ඉතා තද සුළං | විටින් විට පැ.කි.මී.(60-70) පමණ දක්වා වන ඉතා තද සුළං |
| උතුරු-මැද | විටින් විට පැ.කි.මී.(50-60) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(50-60) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(50-60) පමණ දක්වා වන තද සුළං |
| නැගෙනහිර | විටින් විට පැ.කි.මී.(50-60) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(60-70) පමණ දක්වා වන ඉතා තද සුළං | විටින් විට පැ.කි.මී.(50-60) පමණ දක්වා වන තද සුළං |
| සබරගමුව | විටින් විට පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(30-40) පමණ දක්වා වන සුළං | විටින් විට පැ.කි.මී.(30-40) පමණ දක්වා වන සුළං |
| බස්නාහිර | විටින් විට පැ.කි.මී.(50-60) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(50-60) පමණ දක්වා වන තද සුළං | පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තරමක තද සුළං |
| දකුණ | විටින් විට පැ.කි.මී.(30-40) පමණ දක්වා වන සුළං | විටින් විට පැ.කි.මී.(30-40) පමණ දක්වා වන සුළං | විටින් විට පැ.කි.මී.(30-40) පමණ දක්වා වන සුළං |
| ඌව | විටින් විට පැ.කි.මී.(50-60) පමණ දක්වා වන තද සුළං | පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තරමක තද සුළං | විටින් විට පැ.කි.මී.(30-40) පමණ දක්වා වන සුළං |
| වයඹ | විටින් විට පැ.කි.මී.(50-60) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(50-60) පමණ දක්වා වන තද සුළං | පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තරමක තද සුළං |
| මධ්‍යම | විටින් විට පැ.කි.මී.(50-60) පමණ දක්වා වන තද සුළං | විටින් විට පැ.කි.මී.(60-70) පමණ දක්වා වන ඉතා තද සුළං | පැ.කි.මී.(40-50) පමණ දක්වා වන තරමක තද සුළං |

**ඉදිරි දින තුන සඳහා තද වැසි පිළිබඳ අනතුරු ඇඟවීම**

| පළාත | දිස්ත්‍රික්කය | ජනවාරි 08 | ජනවාරි 09 | ජනවාරි 10 |
|---|---|---|---|---|
| උතුර | මුලතිව් | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. (75-100) දක්වා තරමක තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. (100-150) ක පමණ තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. (75-100) දක්වා තරමක තද වැසි |
| | යාපනය | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ට වැඩි තද වැසි |
| | වවුනියා | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. (50-75) දක්වා තරමක තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. (100-150) ක පමණ තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. (75-100) දක්වා තරමක තද වැසි |
| | මන්නාරම | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, (50-75) දක්වා තරමක තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ට වැඩි තද වැසි |

| | | | | |
|---|---|---|---|---|
| | කිලිනොච්චි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, (50-75) දක්වා තරමක තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. (100-150) ක පමණ තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, (75-100) දක්වා තරමක තද වැසි. |
| උතුරු-මැද | අනුරාධපුර | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, (50-75) දක්වා තරමක තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. (75-100) දක්වා තරමක තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, (50-75) දක්වා තරමක තද වැසි |
| | පොලොන්නරුව | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. (100-150) ක පමණ තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. (100-150) ක පමණ තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, (50-75) දක්වා තරමක තද වැසි |
| | අම්පාර | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 150 ට වැඩි ඉතා තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 150 ට වැඩි ඉතා තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි |
| | මඩකලපුව | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 150 ට වැඩි ඉතා තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 150 ට වැඩි ඉතා තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි |
| සබරගමුව | රත්නපුර | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| | කෑගල්ල | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| බස්නාහිර | කොළඹ | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක | වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| | කළුතර | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක | වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| | ගම්පහ | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| දකුණ | ගාල්ල | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක | වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| | මාතර | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| | හම්බන්තොට | විටින් විට වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි | වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |

| | | | | |
|---|---|---|---|---|
| ඌව | මොණරාගල | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| | බදුල්ල | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| වයඹ | කුරුණෑගල | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි. | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි. | විටින් විට වැසි |
| | පුත්තලම | වැසි වාර කිහිපයක් | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි. | විටින් විට වැසි |
| මධ්‍යම | මහනුවර | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. (75-100) දක්වා තරමක තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. (75-100) දක්වා තරමක තද වැසි | වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| | නුවරඑළිය | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| | මාතලේ | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඇතැම් ස්ථාන වලට මි.මි. 100 ට වැඩි තද වැසි | වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |

අවදානම් රහිත　　අඩු අවදානම්　　මධ්‍ය අවදානම්　　අධි අවදානම්

**ගොඩබිම ප්‍රදේශය සඳහා:**

**සිදුවිය හැකි හානි**

- .
- පැල්පත්වලට හා තාවකාලික ඉදි කිරීම්වලට හානි වීම .
- වහලවල ඇති තහඩු උළු ආදිය ගැලවී යාම.
- විදුලි සහ දුරකථන රැහැන් වලට හානි සිදුවිය හැක.
- ගස්වල අතු කැඩීම් සහ මාර්ග අසල ඇති විශාල ගස් ගැලවී යා හැක.
- වී වගා බිම්වලට,කෙසෙල්, පැපොල් වැනි පළතුරු වගාවන් වලටද හානි සිදුවිය හැක.
- වරාය ආශ්‍රිතව නවතා /රඳවා ඇති යාත්‍රා අංගන වලට හානි වීම
- ක්ෂණික ගංවතුර තත්ත්වයන් ඇතිවිය හැක
- වෙරළාසන්න පහත් ගොඩබිම් ප්‍රදේශ මුහුදු ජලයෙන් යටවිය හැක.


අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:

- **වෙරල ආසන්න තාවකාලික පදිංචිකරුවන් ආරක්ෂිත ස්ථාන වලට ගමන් කිරීම. බලපෑම ඇති ප්‍රදේශවල අනෙකුත් පදිංචිකරුවන් නිවාස තුලට වී සිටීම.**
- **කඳුකර ප්‍රදේශ වල (විශේෂයෙන් නාය යාම් අවධානම සහිත ප්‍රදේශ වල) සහ ගංගා ආශ්‍රිතව පහත් බිම් වල ජීවත් වන ජනතාව මේ සම්බන්ධයෙන් විමසිලිමත්වන්න.**
- **කඳුකර ප්‍රදේශ වල මාර්ග භාවිත කරන්නන් සහ රථ වාහන පදවන්නන් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න**
- **කඩාවැටෙන ගස්වලින් සහ විදුලි රැහැන් වලින් ආරක්ෂාවීම.**
- **ගිගුරුම් සහිත වැසි පවත්නා අවස්ථාවල රැහැන් දුරකථන සහ විදුලි උපකරණ භාවිතයෙන් වැළකීම.**

- ඇතිවිය හැකි අයහපත් කාලගුණික තත්වය පිළිබඳ විමසිලිමත්වන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**මුහුදු ප්‍රදේශ සඳහා:**

**Advisory for deep depression over Southeast Bay of Bengal.**
**Issued at 10.30 a.m. on 08 January 2026 for the period until 10.30 a.m. 09 January 2026.**




**මුහුදු ප්‍රදේශ සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- **නැවත දැනුම් දෙන තුරු දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.**
- **උතුරු අක්ෂාංශ 02 - 13 ත් අතර සහ නැගෙනහිර දේශාංශ 76 - 88 ත් අතර මුහුදු ප්‍රදේශයට නැවත දැනුම් දෙන තුරු යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**
- **දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**

**මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අනාවැකි සහ නිවේදන පිළිබඳව, ධීවර සහ නාවික ප්‍රජාව අවධානයෙන් පසුවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

**පද්ධතියේ හැසිරීම පිළිබඳව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිරන්තර අවධානයෙන් සිටියි. මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**



කාර්යයේ නියුතු කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.
දු. ක: 0112 686 686 (පැය 24 ක්‍රියාත්මකයි)

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **05** TCA/26/01/08/01
COLOR: **Red**

# Warning for deep depression over South-east Bay of Bengal Sea area.

Issued by the Natural Hazards Early Warning Centre, Department of Meteorology.
Issued at 10.30 a.m. on 08 January 2026 for the period until 10.30 a.m. 09 January 2026

## For the land and the sea areas around the island

**TAKE ACTION!**

**The depression in the Bay of Bengal to the southeast of Sri Lanka has intensified into a deep depression and is centered near latitude 5.4°N and longitude 85.3°E, about 420 km southeast of Pottuvil at 05.30 a.m. today (08$^{th}$). The above system is currently (10:00 a.m.) located about 300 km southeast of Pottuvil.**

**It is very likely to move west-northwestwards across southwest Bay of Bengal and cross Sri Lanka coast between Hambantota and Kalmunai between 5.30 p.m. to 11.30 p.m. of tomorrow, the 9th January 2026.**

**Hence, showery, and windy condition over the island, particularly in the Northern, North-Central, Eastern, Uva and Central provinces is expected to enhance from today (08$^{th}$).**





Figure- *Deep depression Track. Source: RSMC*

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**For Land area:**

**Strong wind advisory for the next three days.**

| Province | 08th Jan. | 09th Jan. | 10th Jan. |
|---|---|---|---|
| **Northern** | Strong winds (50-60) kmph at times | Very strong winds (60-70) kmph at times | Very strong winds (60-70) kmph at times |
| **North-Central** | Strong winds (50-60) kmph at times | Strong winds (50-60) kmph at times | Strong winds (50-60) kmph at times |
| **Eastern** | Strong winds (50-60) kmph at times | Very strong winds (60-70) kmph at times | Strong winds (50-60) kmph at times |
| **Sabaragamuwa** | Fairly Strong winds (40-50) kmph at times | Winds up to (30-40) kmph at times | Winds up to (30-40) kmph at times |
| **Western** | Strong winds (50-60) kmph at times | Strong winds (50-60) kmph at times | Fairly strong winds (40-50) kmph at times |
| **Southern** | Winds up to (30-40) kmph at times | Winds up to (30-40) kmph at times | Winds up to (30-40) kmph at times |
| **Uva** | Strong winds (50-60) kmph at times | Fairly strong winds (40-50) kmph at times | Winds up to (30-40) kmph at times |
| **North-Western** | Strong winds (50-60) kmph at times | Strong winds (50-60) kmph at times | Fairly strong winds (40-50) kmph at times |
| **Central** | Strong winds (50-60) kmph at times | Very Strong winds (60-70) kmph at times | Fairly strong winds (40-50) kmph at times |

**Heavy rain advisory for the next three days**

| Province | District | 08th Jan. | 09th Jan. | 10th Jan. |
|---|---|---|---|---|
| **Northern** | Mullaittivu | Showers or thundershowers at times; Fairly heavy rainfall about (75- 100) mm at some places | Showers or thundershowers at times ; Heavy rainfall about (100- 150)mm at some places | Showers or thundershowers at times ;Fairly heavy rainfall about (75- 100) mm at some places |
| | Jaffna | Showers or thundershowers at times | Showers or thundershowers at times ; Heavy rainfall above 100 mm at some places | Showers or thundershowers at times; Heavy rainfall above 100 mm at some places |

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

| | | | | |
|---|---|---|---|---|
| | Vavuniya | Showers or thundershowers at times; Fairly heavy rainfall about (50-75) mm at some places | Showers or thundershowers at times ; Heavy rainfall above (100- 150) mm at some places | Showers or thundershowers at times ;Fairly heavy rainfall about (75- 100) mm at some places |
| | Mannar | Showers or thundershowers at times; Fairly heavy rainfall about (50-75) mm at some places | Showers or thundershowers at times ; Heavy rainfall above 100 mm at some places | Showers or thundershowers at times ; Heavy rainfall above 100 mm at some places |
| | Kilinochchi | Showers or thundershowers at times; Fairly heavy rainfall about (50-75) mm at some places | Showers or thundershowers at times; Heavy rainfall above (100- 150) mm at some places | Showers or thundershowers at times; Fairly heavy rainfall about (75- 100) mm at some places |
| **North-Central** | Anuradhapura | Showers or thundershowers at times; Fairly heavy rainfall about (50-75) mm at some places | Showers or thundershowers at times ;Fairly heavy rainfall about (75- 100) mm at some places | Showers or thundershowers at times; Fairly heavy rainfall about (50-75) mm at some places |
| | Polonnaruwa | Showers or thundershowers at times ; Heavy rainfall above 100 mm at some places | Showers or thundershowers at times ; Heavy rainfall above (100- 150) mm at some places | Showers or thundershowers at times. |
| **Eastern** | Trincomalee | Showers or thundershowers at times ; Heavy rainfall above 100 mm at some places | Showers or thundershowers at times; Heavy rainfall above (100- 150) mm at some places | Showers or thundershowers at times; Fairly heavy rainfall about (50-75) mm at some places |
| | Ampara | Showers or thundershowers at times; Very heavy rainfall above 150 mm at some places | Showers or thundershowers at times; Very heavy rainfall above 150 mm at some places | Showers or thundershowers at times. |
| | Batticaloa | Showers or thundershowers at times; Very heavy rainfall above 150 mm at some places | Showers or thundershowers at times; Very heavy rainfall above 150 mm at some places | Showers or thundershowers |
| **Sabaragamuwa** | Rathnapura | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers |

| | | | | |
|---|---|---|---|---|
| | Kegalle | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers |
| **Western** | Colombo | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers |
| | Kaluthara | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers |
| | Gampaha | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers |
| **Southern** | Galle | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers |
| | Matara | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers |
| | Hambanthota | Showers at times | Showers or thundershowers during the evening or night. | Showers or thundershowers |
| **Uva** | Monaragala | Showers or thundershowers at times ; Heavy rainfall above 100 mm at some places | Showers or thundershowers at times; Heavy rainfall above 100 mm at some places | Showers or thundershowers at times. |
| | Badulla | Showers or thundershowers at times; Heavy rainfall above 100 mm at some places | Showers or thundershowers at times; Heavy rainfall above 100 mm at some places | Showers or thundershowers at times. |
| North-western | Kurunegala | Showers or thundershowers at times. | Showers or thundershowers at times. | Showers at times. |
| | Puttalam | Several spells of showers | Showers or thundershowers at times | Showers at times |
| **Central** | Kandy | Showers or thundershowers at times ;Fairly heavy rainfall about (75- 100) mm at some places | Showers or thundershowers at times ;Fairly heavy rainfall about (75- 100) mm at some places | Showers or thundershowers. |

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

| | | | | |
|---|---|---|---|---|
| | Nuwara-Eliya | Showers or thundershowers at times ; Heavy rainfall above 100 mm at some places | Showers or thundershowers at times ; Heavy rainfall above 100 mm at some places | Showers or thundershowers |
| | Matale | Showers or thundershowers at times ; Heavy rainfall above 100 mm at some places | Showers or thundershowers at times ; Heavy rainfall above 100 mm at some places | Showers or thundershowers |

No risk | Low risk | Moderate risk | High risk

## For the Land area:

## DAMAGE EXPECTED:


- **Damage to huts, temporary shelters and light structures**
- **Destroy the roof tops/ sheets etc.**
- **Damage to power and communication lines.**
- **Breaking of tree branches and uprooting of large avenue trees.**
- **Damage to paddy crops, banana, papaya trees and orchards.**
- **Damage to harbor yachts**
- **Flash flood**
- **Sea water inundation in low lying areas in the near coast.**

## Action suggested for the Land area:

- **Coastal hutment dwellers are advised to move to safer places. Other people in the affected areas to remain indoors.**
- **People living in hilly areas (particularly landslide prone areas) and low lying areas in river basins are requested to be vigilant.**
- **Drivers and people using roads in the hilly areas are requested to be vigilant.**
- **Beware of fallen trees and power lines.**
- **Avoid using wired telephones and connected electric appliances during thunderstorms.**
- **General public is requested to be vigilant regarding impending extreme weather situation.**
- **For emergency assistance contact the local disaster management authorities.**
- **Requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regard.**

## For the Sea area:

**Advisory for deep depression over Southeast Bay of Bengal.**
**Issued at 10.30 a.m. on 08 January 2026 for the period until 10.30 a.m. 09 January 2026.**




## Action suggested for the Sea area:

- **<u>Naval and fishing communities are warned not to venture to the deep and shallow sea areas around the island until further notice.</u>**

- **<u>Naval and fishing communities are advised not to venture into the sea areas bounded by (02N - 13N) and between (76E – 88E) until further notice.</u>**
- **Those who are out at aforementioned sea areas are advised to return to coasts or moved safer areas immediately.**

**Navel and fishing communities are requested to be attentive to the forecasts and bulletins issued by the Department of Meteorology in this regard.**

**The Meteorological Department is constantly monitoring the behavior of the system. The general public is requested to be attentive to the future forecasts and bulletins issued by the Department of Meteorology in this regard.**



Duty Meteorologist
Department of meteorology
0112 686 686 (24-hour service)